48?99

AL/2020/22/S-I(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

භූගෝල විද්‍යාව I
புவியியல் I
Geography I

22 S I

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**විභාග අංකය :** ...............................

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත වේ. I කොටස බහුවරණ ප්‍රශ්න **40** කින් සමන්විත වන අතර, ඒවාට පිළිතුරු **මෙම පත්‍රයේ ම** සැපයිය යුතු ය.
* I කොටසේ නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු **එක** බැගින් හිමිවේ.
* II කොටසෙහි ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සැපයිය යුතු ය.
* III කොටස ප්‍රශ්න **හතරකින්** සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
* I, II සහ III කොටස්වල පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දිය යුතු ය.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| I කොටස | 1 - 40 | |
| II කොටස | 1 | |
| | 2 | |
| III කොටස | 3 | |
| | 4 | |
| | 5 | |
| | 6 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |

## I කොටස

● එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර අඩංගු වරණය තෝරා, එහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ ඇති **තිත් ඉර මත** ලියන්න.

1. පහත දැක්වෙන තේමා අතුරෙන් තිත් සිතියමක් මගින් යෝග්‍ය ලෙස නිරූපනය කළ හැකි තේමාව කුමක් ද?
   (1) දිස්ත්‍රික්ක අනුව ජනව්‍යාප්තිය  (2) නාගරික මධ්‍යස්ථානවල ජනසංඛ්‍යා වර්ධනය
   (3) දිස්ත්‍රික්ක අනුව ජනවාර්ගික සංයුතිය  (4) අභයභූමි අතර සිදුවන වන අලි සංක්‍රමණ රටාව
   (5) පළාත් අනුව මාර්ග ඝනත්වය (......)

2. ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය (GPS) හා සම්බන්ධ චන්ද්‍රිකාවක් දිනකට කී වරක් පෘථිවිය වටා පරිභ්‍රමණය වන්නේ ද?
   (1) එක්වරකි.  (2) දෙවරකි.  (3) තුන්වරකි.  (4) සිව්වරකි.  (5) පස්වරකි. (......)

[දෙවැනි පිටුව බලන්න.

3. ශ්‍රී ලංකාවේ 1: 50,000 භූ ලක්ෂණ සිතියම්වල දැක්වෙන ජාතික ඛණ්ඩාංක පද්ධතිය පිහිටුවීම සඳහා පදනම් කරගත් ත්‍රිකෝණමිතික ස්ථානය වන්නේ,
(1) පිදුරුතලාගල (2) සංගමන්කන්ද
(3) දෙවුන්දර තුඩුව (4) පේදුරු තුඩුව
(5) ගෝවින්දහෙල (Westminster Abbey) (……)

4. 1: 50,000 පරිමාණයේ භූ ලක්ෂණ සිතියමක මිලිමීටර 5 කින් දැක්වෙන පාලමක සැබෑ දිග වන්නේ මීටර,
(1) 25 කි. (2) 50 කි. (3) 100 කි. (4) 200 කි. (5) 250 කි. (……)

5. භූගෝලීය තොරතුරු පද්ධතියෙහි සංරචක හතරක් දැක්වෙන වරණය කුමක් ද?
(1) ක්‍රම, දෘඩාංග, පරිගණකය, මෘදුකාංග
(2) දත්ත, දෘඩාංග, මෘදුකාංග, භාවිත කරන්නන්
(3) දෘඩාංග, මෘදුකාංග, පරිගණකය, දත්ත
(4) දත්ත, මෘදුකාංග, අංකිත සිතියම්, දෘඩාංග
(5) දත්ත, අංකිත සිතියම්, භාවිත කරන්නන්, ක්‍රම (……)

6. ප්‍රමාණාත්මක දත්ත සඳහා උදාහරණයක් වන්නේ,
(1) මැතිවරණ පිළිබඳ මහජන ආකල්ප
(2) ජාන වෙනස් කළ ආහාර පිළිබඳ මතවාද
(3) වායු ගෝලීය පීඩනය
(4) පංති කාමරය තුළ සිසුන්ගේ චර්යාව
(5) නිරෝධායන කාලය තුළ ජීවන රටාවේ වෙනස්වීම් (……)

7. ශ්‍රී ලංකාවේ වර්ෂාපතන ව්‍යාප්තිය දැක්වීම සඳහා වඩාත්ම යෝග්‍ය සිතියම් විද්‍යාත්මක ක්‍රමය වන්නේ,
(1) රේඛාංකිත සිතියමයි. (2) ධාරා සිතියමයි.
(3) තිත් සිතියමයි. (4) ක්‍රමාංකිත සංකේත සිතියමයි.
(5) සම සංඛ්‍යා සිතියමයි. (……)

8. ශ්‍රී ලංකාවේ 1: 50,000 භූ ලක්ෂණ සිතියම්වල පර්යන්ත තොරතුරක් නිවැරදිව දක්වා ඇත්තේ කුමන වරණයෙහි ද?
(1) සමෝච්ච රේඛා වර්ග දෙකක් දක්වා ඇත. (2) තැන් උස කළු පාට ත්‍රිකෝණයකින් දක්වා ඇත.
(3) පරිමාණය එක් ක්‍රමයකින් දක්වා ඇත. (4) උතුරු දිශා තුනක් දක්වා ඇත.
(5) දුම්රිය මාර්ග වර්ග දෙකක් දක්වා ඇත. (……)

9. ස්ථානයක නිරපේක්ෂ පිහිටීම නිශ්චය කිරීම සඳහා යොදාගනු ලබන නවීන සිතියම් විද්‍යාත්මක ක්‍රමයක් වන්නේ,
(1) භූගෝලීය තොරතුරු පද්ධතියයි. (2) දත්ත ගබඩා කළමනාකරණ පද්ධතියයි.
(3) රේඩාර් පද්ධතියයි. (4) ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියයි.
(5) දුරස්ථ සංවේදයයි. (……)

10. ශ්‍රී ලංකාවේ 1: 50,000 භූ ලක්ෂණ සිතියමක අඩංගු ලක්ෂණයක් එහි සංකේතය හා වර්ණය අනුව නිවැරදිව ගලපා ඇති පිළිතුර කුමක් ද?
(1) ඓතිහාසික ස්ථානය – දුඹුරු පාට කවය
(2) අඩි පාර – කහ පාට තිත් රේඛාව
(3) හෝටලය – කළු පාට ත්‍රිකෝණය
(4) දුම්රිය නැවතුම – රතු පාට තිත
(5) වැව් බැම්ම – නිල් පාට රේඛාව (……)

11. මානවජන්‍ය උපද්‍රව වර්ග තුනක් නිවැරදිව දැක්වෙන්නේ කුමන වරණයෙහි ද?
(1) නායයෑම්, ලැව්ගිනි, තෙල් කාන්දුවීම
(2) භූමිකම්පා, කාර්මික උපද්‍රව, නායයෑම්
(3) කාර්මික උපද්‍රව, යුද්ධය, තෙල් කාන්දුවීම
(4) ගංවතුර, ලැව්ගිනි, කාර්මික උපද්‍රව
(5) ගංවතුර, නායයෑම්, රසායනික උපද්‍රව (……)


Lanka

Lanka

**12.** කාන්තාර ප්‍රදේශවල සුළං ක්‍රියාව නිසා ඇතිවන නිධිසාධිත භූ රූපයක් වන්නේ,
(1) ඩ්‍රම්ලින. (2) ගල්වන.
(3) තාරකා වැලි වැටි. (4) ඉන්සෙල්බර්ග්.
(5) සොයිගම. (……)

**13.** ප්‍රධාන භූ කාරක තැටියක් සඳහා උදාහරණයක් වන්නේ කුමක් ද?
(1) අරාබි තැටිය (2) නැස්කා තැටිය
(3) කැරිබියානු තැටිය (4) අප්‍රිකානු තැටිය
(5) කොකෝස් තැටිය (……)

**14.** ගංගා භාරය පරිවහනය කෙරෙන ක්‍රම හතරක් නිවැරදිව දක්වන්නේ කුමන වරණයෙහි ද?
(1) ද්‍රාවණය, අවලම්බනය, පිනුම් ගමන, පෙරළි ගමන
(2) පිනුම් ගමන, උල්ලේඛය, පෙරළි ගමන, සංඝර්ෂණය
(3) අවලම්බනය, ඝර්ෂණය, පෙරළි ගමන, පිනුම් ගමන
(4) අවලම්බනය, ද්‍රාවණය, පිනුම් ගමන, සංඝර්ෂණය
(5) ඝර්ෂණය, සංඝර්ෂණය, ද්‍රාවණය, උල්ලේඛය (……)

**15.** නිෂ්ක්‍රාන්ත යමහල් භූරූප තුනක් ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) කල්දේරාව, ලාවා සානුව, සංයුක්ත කේතු
(2) ඩයික, කල්දේරාව, ආස්තර
(3) ආස්තර, ලාවා සානුව, සංයුක්ත කේතු
(4) ලැකොලිත, යමහල් අළු කේතු, ඩයික
(5) සංයුක්ත කේතු, යමහල් අළු කේතු, ආස්තර (……)

**16.** ශ්‍රී ලංකාවේ වනජීවී අභයභූමි දෙකක් දැක්වෙන වරණය කුමක් ද?
(1) මුතුරාජවෙල, හෝර්ටන් තැන්න
(2) රන්ටැඹේ, මින්නේරිය
(3) චුන්ඩිකුලම්, බූන්දල
(4) රන්දෙනිගල, චුන්ඩිකුලම්
(5) වික්ටෝරියා, විල්පත්තුව (……)

**17.** නායයෑමක් ඇතිවීමට දායක වන මානව ක්‍රියාකාරකම් දෙකක් ඇතුළත් නිවැරදි වරණය කුමක් ද?
(1) පිපිරවීම් නිසා ඇතිවන කම්පනය සහ පාෂාණ ජීරණය වීම
(2) කඳුකර බෑවුම්වල වනහරණය සහ අධික වර්ෂාපතනය
(3) අධික වර්ෂාපතනය සහ ස්වාභාවික ජල මාර්ග අවහිර කිරීම
(4) බෑවුම් ප්‍රදේශවල ඉදිකිරීම් සහ පාෂාණ ජීරණය වීම
(5) කඳුකර බෑවුම්වල වනහරණය සහ පිපිරවීම් නිසා ඇතිවන කම්පනය (……)

**18.** ආග්නේය පාෂාණ වර්ග තුනක් ඇතුළත් වන්නේ කුමන වරණයෙහි ද?
(1) බැසෝල්ට්, ග්‍රැනයිට්, කිරිගරුඬ
(2) ග්‍රැනයිට්, මයිකා, ඔබ්සිඩියන්
(3) ඔබ්සිඩියන්, නයිස්, මයිකා
(4) ගැබ්රෝ, ඇන්ඩසයිට්, ඔබ්සිඩියන්
(5) බැසෝල්ට්, ඩොලමයිට්, ගැබ්රෝ (……)

**19.** ශ්‍රී ලංකාවේ කඳුකර වනාන්තරවල ප්‍රධාන ලක්ෂණයක් වන්නේ,
(1) ශාක විවිධත්වය අඩුවීමයි.
(2) ශාක කටු සහිත වීම සහ ඝන පත්‍රවලින් යුක්තවීමයි.
(3) ප්‍රමුඛ වෘක්ෂලතා වර්ගය ලඳු කැලෑ වීමයි.
(4) ගස්වල උස මීටර 15-20 අතර වීමයි.
(5) අපිශාක වර්ග සංඛ්‍යාවෙන් අඩුවීමයි. (……)

**20.** ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ සහ වියළි කලාපයේ පොදුවේ දක්නට ලැබෙන පස් වර්ගය කුමක් ද?
(1) රතු කහ පොඩ්සොලික් (2) රතු කහ ලැටසොල්ස්
(3) රතු දුඹුරු (4) දියළු
(5) රතු දුඹුරු ලැටසොල්ස් (……)


[හතරවැනි පිටුව බලන්න.

**21.** පෘථිවි අභ්‍යන්තරයෙහි පිහිටි 'කොන්රඩ් අසන්තතිය' මගින් වෙන් කරනු ලබන්නේ,
(1) හරය, ප්‍රාවරණයෙනි.
(2) බාහිර හරය, අභ්‍යන්තර හරයෙනි.
(3) ඉහළ ප්‍රාවරණය, පහළ ප්‍රාවරණයෙනි.
(4) කබොල, ප්‍රාවරණයෙනි.
(5) සියල් ස්තරය, සිමා ස්තරයෙනි. (......)

**22.** මෙසෝගෝලයෙහි ප්‍රධාන ගති ලක්ෂණයක් වන්නේ,
(1) වේගවත් සුළං පැවතීමයි.
(2) සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 1500 ක් පමණ වීමයි.
(3) ඕසෝන් වායුව මෙම ස්තරයෙහි පැවතීමයි.
(4) උන්නතාංශය සමග උෂ්ණත්වය ඉහළ යාමයි.
(5) සූර්යයාගේ පාරජම්බුල කිරණ මෙම ස්තරයෙන් අවශෝෂණය වීමයි. (......)

**23.** ශ්‍රී ලංකාවේ වියළි පතන තණ බිම් තුනක පිහිටීම නිවැරදිව දැක්වෙන්නේ කුමන වරණයෙහි ද?
(1) රක්වාන, බණ්ඩාරවෙල, වැලිමඩ
(2) වැලිමඩ, අඹේවෙල, රක්වාන
(3) බණ්ඩාරවෙල, කඳපොල, සිංහරාජ
(4) රක්වාන, සිංහරාජ, කඳපොල
(5) අඹේවෙල, වැලිමඩ, සීතාඑළිය (......)

**24.** යාබදව දක්වා ඇති ඔස්ට්‍රේලියාවේ සිතියමේ A, B සහ C ලෙස ලකුණු කර ඇති බියෝම් වර්ග අනුපිළිවෙලින් දක්වා ඇත්තේ කුමන වරණයෙහි ද?




(1) නිවර්තන වර්ෂා වනාන්තර, සැවානා, කාන්තාර
(2) සැවානා, මධ්‍යධරණී වනලැහැබ්, තණ බිම්
(3) කාන්තාර, නිවර්තන වර්ෂා වනාන්තර, මධ්‍යධරණී වනලැහැබ්
(4) නිවර්තන වර්ෂා වනාන්තර, තණ බිම්, කාන්තාර
(5) සැවානා, සෞම්‍ය කලාපීය වර්ෂා වනාන්තර, මධ්‍යධරණී වනලැහැබ් (......)

**25.** වායුගෝලයට හරිතාගාර වායු විමෝචනය කරන ප්‍රධානතම අංශය වන්නේ,
(1) කාර්මික (2) බලශක්ති (3) වාණිජ (4) ප්‍රවාහන (5) කෘෂිකාර්මික (......)

**26.** එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුව, වසර 2050 වන විට ලෝකයේ වඩාත් නාගරීකරණයට පත්වන කලාපය වන්නේ,
(1) යුරෝපය යි. (2) උතුරු ඇමෙරිකාව යි.
(3) ලතින් ඇමෙරිකාව යි. (4) ආසියාව යි.
(5) අප්‍රිකාව යි. (......)

**27.** පහත සඳහන් ඒවා අතුරෙන් ලෝක ජනසංඛ්‍යාවේ ප්‍රධාන සංකේන්ද්‍රණ හතරක් නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) නැගෙනහිර ආසියාව, මැද පෙරදිග, යුරෝපය හා දකුණුදිග අප්‍රිකාව
(2) උතුරු අප්‍රිකාව, කැරිබියන්, දකුණු ආසියාව හා යුරෝපය
(3) දකුණු ආසියාව, අග්නිදිග ආසියාව, දකුණුදිග අප්‍රිකාව හා යුරෝපය
(4) යුරෝපය, උතුරු ඇමෙරිකාව, දකුණු ආසියාව හා මැද පෙරදිග
(5) නැගෙනහිර ආසියාව, දකුණු ආසියාව, අග්නිදිග ආසියාව හා යුරෝපය (......)

**28.** රටක ජනසංඛ්‍යා වර්ධනය පැහැදිලි කිරීමට යොදා ගත හැකි ප්‍රධාන සාධක තුන වන්නේ,
(1) උපත්, මරණ, ව්‍යාප්තිය
(2) උපත්, ව්‍යාප්තිය, සංක්‍රමණය
(3) උපත්, මරණ, සංක්‍රමණය
(4) ව්‍යාප්තිය, සංක්‍රමණය, මරණ
(5) ව්‍යාප්තිය, සංක්‍රමණය, සංචලනය (......)

**29.** අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමය (ASEAN) ස්ථාපිත කිරීමට ආරම්භක සාකච්ඡාව පැවැත්වූ නගරය කුමක් ද?
(1) ක්වාලාලුම්පූර් (2) මැනිලා (3) බැංකොක් (4) ජාකර්තා (5) හැනොයි (......)

**30.** වර්තමානයේ දී ලෝකයේ ගල් අඟුරු නිෂ්පාදනය කරන ප්‍රධානතම රට වන්නේ,
(1) ඉන්දුනීසියාව යි. (2) ඉන්දියාව යි.
(3) ඔස්ට්‍රේලියාව යි. (4) ඇමෙරිකා එක්සත් ජනපදය යි.
(5) චීනය යි. (......)

**31.** යුරෝපා සංගමය යනු,
(1) නිදහස් වෙළඳ සංවිධානයකි.
(2) ආර්ථික සහ දේශපාලනික සංවිධානයකි.
(3) හමුදාමය සන්ධානයකි.
(4) ජාත්‍යන්තර පාරිසරික සංවිධානයකි.
(5) තෙල් අපනයන කරන රටවල සන්ධානයකි. (......)

**32.** අධි තාක්ෂණික කර්මාන්ත ස්ථානගතවීම තීරණය කරනු ලබන ප්‍රධාන සාධකය කුමක් ද?
(1) අමුද්‍රව්‍ය ලබාගත හැකිවීම
(2) ප්‍රධාන ගුවන් තොටුපලවලට සමීපව පිහිටීම
(3) ප්‍රධාන වෙළඳපොළවලට පිවිසීමේ පහසුව
(4) විශ්වවිද්‍යාලවලට හා පර්යේෂණ ආයතනවලට පිවිසීමේ පහසුව
(5) ලාභදායී ශ්‍රමය ලබාගත හැකිවීම (......)

**33.** ලෝක කෘෂිකර්මාන්තයේ ඒකාධිකාරය හිමි කරගෙන ඇත්තේ,
(1) ඇමෙරිකා එක්සත් ජනපදයේ ධනවත් ගොවීන් ය.
(2) බහු ජාතික සමාගම් ය.
(3) සංවර්ධිත රටවල ජාන තාක්ෂණවේදීන් ය.
(4) විදේශීය සෘජු ආයෝජකයින් ය.
(5) ජාත්‍යන්තර වාණිජ බැංකුකරුවන් ය. (......)

**34.** මහවැලි ජනාවාසවල කැපී පෙනෙන ලක්ෂණයක් නිවැරදි ලෙස සඳහන් වන පිළිතුර කුමක් ද?
(1) ජනාවාසවල ධූරාවලියක් නොමැත.
(2) කුටුම්භ ඉඩම් ඒකකවල ව්‍යාප්තිය රේඛීය රටාවට අනුකූලය.
(3) ජනාවාස පොකුරු රටාවට අනුකූලය.
(4) ගෙවතු සහ කුඹුරු ඉඩම් කට්ටි විශාලත්වයෙන් එක සමානය.
(5) ජනාවාස විසුරුණු රටාවට අනුකූලය. (......)

**35.** ශ්‍රී ලංකාවේ මිනිරන් නිෂ්පාදනය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) මෙරට බොහෝ නිෂ්පාදන කර්මාන්තවලට අවශ්‍ය අමුද්‍රව්‍ය සපයයි.
(2) ප්‍රධාන වශයෙන්ම නිමි ද්‍රව්‍යයක් ලෙස අපනයනය කරයි.
(3) වැඩි වශයෙන් අමුද්‍රව්‍යයක් ලෙස කාර්මික රටවලට අපනයනය කරයි.
(4) වැඩි වශයෙන් නිෂ්පාදනය කරන්නේ මයිකා මිනිරන් වර්ගයයි.
(5) සම්පූර්ණයෙන්ම නවීන තාක්ෂණය මත රඳා පවතී. (......)

**36.** එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනේ (UNEP) ප්‍රධාන අරමුණ වන්නේ,
(1) දේශගුණික විපර්යාසවලට විසඳුම් සැපයීමයි.
(2) තිරසර සංවර්ධනය පවත්වාගෙන යාම යි.
(3) ආපදා කළමණාකරණයේදී සහාය වීම යි.
(4) පරිසර ප්‍රමිති සහ ක්‍රියාකාරකම් බලගැන්වීම යි.
(5) පරිසර දූෂණය පාලනය කිරීම යි. (......)

**37.** 2012 ජන හා නිවාස සංගනනයට අනුව, ශ්‍රී ලංකාවේ බහුල වශයෙන් අන්තඃ සංක්‍රමණය (In-migration) වාර්තා වූ පළාත් වන්නේ,
(1) උතුර, උතුරු මැද සහ නැගෙනහිර යි. (2) උතුරු මැද, දකුණ සහ මධ්‍යම යි.
(3) නැගෙනහිර, බස්නාහිර සහ උතුර යි. (4) බස්නාහිර, උතුර සහ සබරගමුව යි.
(5) බස්නාහිර, වයඹ සහ උතුරු මැද යි. (......)

**38.** භූගත ජල සැපයුම මත ප්‍රධාන වශයෙන් යැපෙන ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්‍රියාකාරකමක් නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) මහවැලි සංවර්ධන ව්‍යාපෘති ප්‍රදේශයේ වී ගොවිතැන
(2) යාපනය අර්ධද්වීපයේ එළවළු ගොවිතැන
(3) තෙත් කලාපයේ සියුම් පාරිභෝගික ගොවිතැන
(4) කඳුකරයේ එළවළු ගොවිතැන
(5) සබරගමුව පළාතේ අපනයන භෝග වගාව (......)

**39.** ගෝලීයකරණය නිසා සංවර්ධනය වෙමින් පවතින රටවලට ඇති වූ හිතකර බලපෑමක් වන්නේ,
(1) පොහොසත් සහ දුප්පත් ජනතාව අතර ආදායම් පරතරය අඩු වීම යි.
(2) සම්ප්‍රදායික ගෘහ කර්මාන්ත සංවර්ධනය දිරිමත් කිරීම යි.
(3) විදේශීය ඍජු ආයෝජන මගින් දේශීය ආර්ථිකය ශක්තිමත් වීම යි.
(4) ජාතික හර පද්ධති සහ සම්ප්‍රදායන් ශක්තිමත් වීම යි.
(5) ජනවාර්ගික අරගල සහ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් දුර්වල වීම යි. (......)

**40.** ශ්‍රී ලංකාවේ අනුගමනය කෙරෙන 'පසු අස්වනු තාක්ෂණයෙහි' ප්‍රධාන අරමුණ වන්නේ,
(1) එළවළු සහ පළතුරුවලට කෘමිනාශක හා සුරක්ෂක ඉසීම යි.
(2) වී අස්වැන්න කමතේදීම අලෙවි කිරීම යි.
(3) අලෙවිකරණ ක්‍රියාවලියේදී අතරමැදියාගේ මැදිහත්වීම වැළැක්වීම යි.
(4) අපතේ යාම අවම කර ගැනීම සඳහා යෝග්‍ය ඇසුරුම් භාවිතා කිරීම යි.
(5) වී අස්වනු නෙලාගත් සැනින් කුඹුරු ගිනි තැබීම යි. (......)

* *

48899

AL/2020/22/STE-I(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

NEW

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020


ප්‍රශ්න අංකය / வினா இல. / Question No. 2

භූගෝල විද්‍යාව I / புவியியல் I / Geography I

II කොටස / பகுதி II / PART II

22 STE I

විභාග අංකය / சுட்டெண் / Index No ..............................




Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

භූගෝල විද්‍යාව I
புவியியல் I
Geography I

22 S I

**උපදෙස්:**

* II කොටසෙහි ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සැපයිය යුතු ය.
* III කොටස ප්‍රශ්න **හතරකින්** සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
* මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා 1:50,000 රත්නපුර භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් ද ලෝක ආකෘති සිතියමක් ද ප්‍රස්තාර කඩදාසි ද සපයනු ලැබේ.

## II කොටස

**1.** ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 1:50,000 පරිමාණයේ රත්නපුර භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් ඔබට සපයා ඇත. එහි සමෝච්ච රේඛා අන්තරය මීටර 20 කි. එම සිතියම පදනම් කරගනිමින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**සැලකිය යුතුයි:**

* **ප්‍රශ්න අංකය** සහ අදාළ **උප කොටස්වල අංක** පිළිතුරු පත්‍රයේ පැහැදිලි ව සඳහන් කළ යුතු ය.
* **පිළිතුරු සිතියමෙහි ලිවිය යුතු නො වේ.**
* සිතියම ඔබේ පිළිතුරු පත්‍රයට ඇමිණිය යුතු **නො වේ**.

(i) සිතියමේ දක්වා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) **A** සහ **B** චතුරස්‍ර තුළ දක්නට ලැබෙන ජලවහන ලක්ෂණ **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) සිතියමේ **C - D** සහ **E - F** රේඛා මගින් සළකුණු කර ඇති නිම්න වර්ග **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(iv) සිතියමේ **G - H, J - K, L - M** සහ **N - O** රේඛා මගින් දක්වා ඇති භූ රූප ලක්ෂණ **හතර** පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)

(v) සිතියමේ **P** චතුරස්‍රය තුළ දක්නට ලැබෙන කෘෂි භූමි පරිභෝග වර්ග **හයක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(vi) සිතියම් ප්‍රදේශයෙහි කැපී පෙනෙන ජලවහන රටාව නම් කර, එම ජලවහන රටාව සහ භූ විෂමතාව අතර ඇති සම්බන්ධතාව කරුණු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(vii) සිතියම් ප්‍රදේශයෙහි නැගෙනහිර හා බටහිර අර්ධයන්හි කෘෂිකර්මය, ජනාවාස සහ මාර්ග ජාලය සන්සන්දනාත්මකව විස්තර කරන්න. (ලකුණු 06 යි)

**2.** සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි සම්මත සංකේත හා වර්ණ යොදා ගනිමින් මතු සඳහන් දෑ **ලකුණු කර නම් කරන්න.**

(i) වොල්ගා ගංගාව
(ii) බයිකල් විල
(iii) නිව්යෝර්ක් නගරය
(iv) පිනාටුබෝ ගිනිකන්ද
(v) සමකය
(vi) පැම්පාස් තණ බිම
(vii) මහා බාධක වැටිය
(viii) ගල්ෆ් ප්‍රවාහය
(ix) නාගරික ජන සංඛ්‍යාව 100% ක් වූ අග්නිදිග ආසියාතික රාජ්‍යය
(x) COVID - 19 ආරම්භ වූ බවට වාර්තා වූ චීන නගරය

(ලකුණු 10 යි)

[අටවැනි පිටුව බලන්න.

## III කොටස

3. (i) ද්විතීයික දත්ත යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) ද්විතීයික දත්ත මූලාශ්‍රයක් වශයෙන් අන්තර්ජාලයෙහි ප්‍රයෝජන **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

(iii) ද්විතීයික දත්ත භාවිතයේ දී පර්යේෂකයෙකු මුහුණපාන ගැටලු **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) ද්විතීයික දත්ත මූලාශ්‍ර ලෙස සිතියම් සහ චන්ද්‍රිකා ප්‍රතිබිම්භ අතර ඇති වෙනස්කම් **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

4. (i) නවීන සිතියම් විද්‍යාව යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ii) නවීන සිතියම් විද්‍යාව ප්‍රචලිත වීමට බලපෑ හේතු **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii) දූරස්ථ සංවේද වේදිකා **දෙකක** ප්‍රධාන ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) භූගෝලීය තොරතුරු පද්ධතියෙහි භාවිතයට ගනු ලබන දෛශික හා සිව්රුස් දත්ත ආකෘතිවල වෙනස දළ සටහන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

5. තෝරාගත් ආසියානු රටවල් කිහිපයක 2017 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයෙහි ආංශික සංයුතිය වගුව 1 හි දැක්වේ.

වගුව 1: තෝරාගත් ආසියානු රටවල් කිහිපයක දළ දේශීය නිෂ්පාදිතයෙහි ආංශික සංයුතිය - 2017 (ඇමෙරිකානු ඩොලර් මිලියනවලින්)

| රට | කෘෂිකර්මය | කර්මාන්ත | සේවා |
|---|---|---|---|
| චීනය | 1 833 590 | 9 400 050 | 11 976 360 |
| ඉන්දියාව | 1 458 996 | 2 179 020 | 5 826 510 |
| ජපානය | 59 874 | 1 638 343 | 3 739 341 |
| දකුණු කොරියාව | 4 477 | 799 755 | 1 186 405 |
| තායිලන්තය | 101 352 | 447 432 | 687 216 |

මූලාශ්‍රය: http://data.worldbank.org

(i) වගුව 1 හි දැක්වෙන දත්ත නිරූපනය කිරීම සඳහා බහු තීරු ප්‍රස්තාරයක් අඳින්න. (මෙම නිර්මාණය සඳහා වෙනම ප්‍රස්තාර කඩදාසියක් ලබා ගන්න.) (ලකුණු 08 යි)

(ii) ඔබ අඳින ලද ප්‍රස්තාරය ප්‍රයෝජනයට ගනිමින්, තෝරාගත් ආසියානු රටවල දළ දේශීය නිෂ්පාදිතයේ කැපී පෙනෙන ලක්ෂණ **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(iii) වගුව 1 හි දැක්වෙන දත්ත නිරූපනය කිරීම සඳහා යෝග්‍ය වෙනත් ප්‍රස්තාරික ක්‍රමයක් නම් කර එය කටු සටහන් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

6. 2019 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ ඩෙංගු රෝගීන්ගේ දිස්ත්‍රික්ක මට්ටමේ ව්‍යාප්තිය වගුව 2 හි දැක්වේ.

වගුව 2: ශ්‍රී ලංකාවේ ඩෙංගු රෝගීන්ගේ ව්‍යාප්තිය-2019 (දිස්ත්‍රික්ක මට්ටමින්)

| අනු අංකය | දිස්ත්‍රික්කය | රෝගීන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | කොළඹ | 20 718 |
| 2 | ගම්පහ | 16 573 |
| 3 | කළුතර | 8 395 |
| 4 | ගාල්ල | 7 378 |
| 5 | මාතර | 4 054 |
| 6 | හම්බන්තොට | 2 049 |
| 7 | රත්නපුර | 4 086 |
| 8 | කෑගල්ල | 2 716 |
| 9 | කුරුණෑගල | 3 218 |
| 10 | පුත්තලම | 2 257 |
| 11 | මහනුවර | 8 940 |
| 12 | මාතලේ | 2 445 |
| 13 | නුවරඑළිය | 438 |
| 14 | බදුල්ල | 1 922 |
| 15 | මොණරාගල | 333 |
| 16 | යාපනය | 8 261 |
| 17 | කිලිනොච්චි | 396 |
| 18 | වවුනියාව | 872 |
| 19 | මුලතිව් | 268 |
| 20 | මන්නාරම | 271 |
| 21 | අනුරාධපුර | 1 164 |
| 22 | පොළොන්නරුව | 561 |
| 23 | ත්‍රිකුණාමලය | 2 969 |
| 24 | මඩකලපුව | 2 848 |
| 25 | අම්පාර | 338 |
| | **එකතුව** | **103 470** |

මූලාශ්‍රය: වසංගත රෝගවේද ඒකකය, සෞඛ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව, 2020


(i) වගුව 2 හි දැක්වෙන දත්තවලින් පෙන්නුම් කරන ශ්‍රී ලංකාවේ ඩෙංගු රෝගීන්ගේ දිස්ත්‍රික්ක මට්ටමේ ව්‍යාප්තියෙහි කැපී පෙනෙන ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඉහත දත්ත පදනම් කරගෙන පන්ති ප්‍රාන්තර, ප්‍රගණන ලකුණු, සංඛ්‍යාතය, සමුච්චිත සංඛ්‍යාතය සහ ප්‍රතිශත සමුච්චිත සංඛ්‍යාතය ඇතුළත් වගුවක් සකස් කරන්න.
(පන්ති ප්‍රාන්තරය 4 200 ලෙස සලකන්න. පළමු පන්තියේ ආරම්භක අගය ශූන්‍යය විය යුතුය.) (ලකුණු 05 යි)

(iii) ඉහත (ii) හි ඔබ සකස් කළ වගුව පදනම් කරගෙන ප්‍රතිශත සමුච්චිත සංඛ්‍යාත වක්‍රයක් නිර්මාණය කරන්න.
(මෙම අභ්‍යාසය සඳහා වෙනම ප්‍රස්තාර කඩදාසියක් ලබා ගන්න.) (ලකුණු 05 යි)

(iv) ප්‍රතිශත සමුච්චිත සංඛ්‍යාත වක්‍රයෙහි ප්‍රයෝජන දෙකක් දක්වන්න. (ලකුණු 03 යි)

***




SCALE 1 : 50,000

සමෝච්ච රේඛා අන්තරය මීටර 20
சமவுயரக்கோட்டு இடைவெளி 20 மீற்றர்
Contour Interval 20 metres

Lanka

48899

AL/2020/22/S-II(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

භූගෝල විද්‍යාව II
புவியியல் II
Geography II

22 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස් :**
✳ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්වත්** තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස - භෞතික භූගෝල විද්‍යාව

**1.** (i) ලෝකයේ ග්ලැසියර පිහිටි ප්‍රධාන ප්‍රදේශ **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) නිම්න ග්ලැසියර ප්‍රදේශවල ඛාදනය සිදුවන ආකාර **තුන** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) මහාද්වීපික ග්ලැසියර ප්‍රදේශවල ඛාදන ක්‍රියාව මගින් නිර්මාණය වන භූ රූප **තුනක්** සුදුසු රූප සටහන් සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) මහාද්වීපික ග්ලැසියර ප්‍රදේශවල නිධිසාධනය මගින් නිර්මාණය වන භූ රූප **තුනක්** සුදුසු රූප සටහන් සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**2.** (i) කොපන්ගේ ලෝක දේශගුණික වර්ගීකරණයෙහි ප්‍රධාන දේශගුණ වර්ග **හතරක්** අදාළ අක්ෂර සහිතව නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) කොපන්ගේ ලෝක දේශගුණික වර්ගීකරණයෙහි ඔබ උගත් එක් වර්ගයක් තෝරාගෙන එහි කැපීපෙනෙන ලක්ෂණ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) නිරිතදිග මෝසම් සෘතුවේදී ශ්‍රී ලංකාවට ලැබෙන වර්ෂාපතනයෙහි භූගෝලීය ව්‍යාප්ති රටාවේ ප්‍රධාන ගති ලක්ෂණ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ ස්වාභාවික වෘක්ෂලතාවරණය කෙරෙහි නිරිතදිග මෝසම් වර්ෂාව බලපා ඇති ආකාරය නිදසුන් **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**3.** (i) 'ස්වාභාවික උපද්‍රවය' සහ 'ආපදාව' යන යෙදුම්වලින් අදහස්වන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) පහත දැක්වෙන ස්වාභාවික උපද්‍රවවලින් ඕනෑම **එකක** කැපීපෙනෙන ලක්ෂණ **තුනක්** විස්තර කරන්න.

(a) ගංවතුර (b) නායයෑම් (c) භූමිකම්පා (ලකුණු 06 යි)

(iii) ඔබ ඉහත (ii) හි තෝරා ගන්නා ලද ස්වාභාවික උපද්‍රවයෙන් මානව පරිසරයට ඇති බලපෑම් **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) ආපදා කළමනාකරණ චක්‍රයෙහි පෙර-සූදානම් අවධිය සඳහා ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ගෙන ඇති පියවර **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

**4.** (i) බියෝම්වල වෙනස්කම් හඳුනාගැනීමට වෙහෙල්වන සාධක **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

## II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

**5.** 1950-55 සිට 2015-20 දක්වා කාල පරිච්ඡේද තුළ ලෝකයේ දළ මරණ ශීඝ්‍රතාව (අනුපාතිකය) පිළිබඳ දත්ත වගුව **1** හි දක්වා ඇත.

වගුව **1**: ලෝකයේ දළ මරණ ශීඝ්‍රතාව

| කලාපය | 1950-55 | 1970-75 | 1990-95 | 2010-15 | 2015-20 |
|---|---|---|---|---|---|
| වඩා දියුණු රටවල් | 10.6 | 9.5 | 10.0 | 9.9 | 10.2 |
| අඩු දියුණු රටවල් | 23.1 | 12.9 | 8.9 | 7.2 | 7.0 |
| අප්‍රිකාව | 26.7 | 18.7 | 14.3 | 9.3 | 8.2 |
| ආසියාව | 22.6 | 12.0 | 8.0 | 6.9 | 6.9 |
| යුරෝපය | 11.2 | 10.2 | 11.2 | 10.9 | 11.0 |
| ලතින් ඇමෙරිකාව සහ කැරිබියන් | 15.5 | 9.5 | 6.5 | 6.0 | 6.3 |
| උතුරු ඇමෙරිකාව | 9.5 | 9.2 | 8.6 | 8.1 | 8.6 |
| ඕෂනියාව | 13.3 | 9.5 | 7.6 | 6.9 | 6.8 |

මූලාශ්‍රය : United Nations, Population Division, World Population Prospects, 2019

(i) 'දළ මරණ ශීඝ්‍රතාව' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) වගුව **1** හි අඩංගු දත්ත ඇසුරෙන්, ලෝක දළ මරණ ශීඝ්‍රතාවේ කැපීපෙනෙන ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) ඉහත (ii) හි ඔබ සඳහන් කළ කැපීපෙනෙන ලක්ෂණවලින් දෙකක් තෝරාගෙන, එක් එක් ලක්ෂණයට බලපා ඇති සාධක **දෙක** බැගින් කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

(iv) නිදහසින් පසු කාලයේදී ශ්‍රී ලංකාවේ දළ මරණ ශීඝ්‍රතාව පහත බැසීමට හේතු වූ සාධක **හතරක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

**6.** (i) ආහාර නිෂ්පාදනය වැඩි කිරීම සඳහා කෘෂිකර්මාන්තයෙහි භාවිත කෙරෙන නව තාක්ෂණික ශිල්පක්‍රම අයත්වන අංශ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඉහත (i) හි සඳහන් කළ එක් අංශයක් තෝරාගෙන, ආහාර නිෂ්පාදනය වැඩි කිරීම සඳහා එය දායක වී ඇත්තේ කෙසේ දැයි නිදසුන් **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iii) කෘෂිකර්මාන්තයේ භාවිත නව තාක්ෂණික ශිල්ප ක්‍රමවල අහිතකර බලපෑම් **තුනක්** පරීක්ෂා කරන්න. (ලකුණු 06 යි)

(iv) ඉහත (iii) හි ඔබ සඳහන් කළ අහිතකර බලපෑම් අවමකර ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග **තුනක්** කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

**7.** (i) 'නිෂ්කර්ෂක කර්මාන්තයක්' යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ii) ලෝකයේ යපස් නිධිවල භූගෝලීය ව්‍යාප්ති රටාවේ කැපීපෙනෙන ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ලෝක යපස් වෙළඳාමේ ප්‍රවණතා **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) ලෝකයේ නිෂ්කර්ෂක කර්මාන්තය මුහුණ පා ඇති ගැටලු **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

**8.** (i) 'සංචාරකයා' යන යෙදුමෙන් අදහස් වන්නේ කවරෙක් ද? (ලකුණු 02 යි)

(ii) සංචරණයෙහි ප්‍රභේද **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයෙන් ලැබෙන ආර්ථික ප්‍රතිලාභ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

48935



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

NEW

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

ප්‍රශ්න අංකය
வினா இல.
Question No. 2

භූගෝල විද්‍යාව I
புவியியல் I
Geography I

II කොටස
பகுதி II
PART II

22 STE I

විභාග අංකය
சுட்டெண்
Index No ...




NEW

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

22 I

භූගෝල විද්‍යාව I
புவியியல் I
Geography I




SCALE 1 : 50,000

සමෝච්ච රේඛා අන්තරය මීටර 20
சமவுயரக்கோட்டு இடைவெளி 20 மீற்றர்
Contour Interval 20 metres